# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 57 දරන මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. **4.00** යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

## 2007 අංක 57 දරන මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 19/2005

### මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු කාරණා හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී සමිතිය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 57 දරන මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතියේ (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය" යනුවෙන් යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. මධ්‍යම ලංකා මුස්ලිම් කාන්තා සමිතිය සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) මූලස්ථානය වශයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, උපකරණ සැපයීම හා පවත්වාගෙන යාම ;

2—P L 002402-2,800 (2007/08)

(ආ) මුස්ලිම් තරුණ ළමුන් උදෙසා කුර්-ආන් පන්ති පැවැත්වීම;

(ඇ) පාසල් හැර ගිය මුස්ලිම් භක්තිකයන් වෙනුවෙන් වෘත්තීය පුහුණු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ;

(ඈ) වයෝවෘද්ධ හා අනාථ දුගී මුස්ලිම්වරු උදෙසා සමාජ සේවය කිරීම පිළිබඳව දැනුවත් කිරීම ;

(ඉ) සමූහ අවශ්‍යතා හඳුනාගෙන විවාහ උපදේශක සේවා සැපයීම සහ අවශ්‍යතා ඇති අයට විවාහයන් සිදු කිරීම ;

(ඊ) විශේෂයෙන් වයෝවෘද්ධ මුස්ලිම් කාන්තාවන් උදෙසා මූලස්ථානයේ පුස්තකාලයක් හා විනෝද ක්‍රීඩා ශාලාවක් පිහිටුවා නඩත්තු කිරීම ;

(උ) ගැහැණු ළමුන් සඳහා අනාථ නිවාසයක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඌ) මධ්‍යම පළාතේ නොයෙකුත් ප්‍රදේශවල සමිතියේ ශාඛා පිහිටුවීම ;

(එ) මේ පනතේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සෞඛ්‍ය කඳවුරු සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වසා දැමීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව සතුව පවතින හෝ භාරව සිටින හෝ දරා සිටින යම් කිසි ඉඩමක යම් කිසි ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ද සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ නංවාලීම හෝ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර ආකාරයේ වුව ද, සියලු ක්‍රියා, කාරණා හා දේවල් ද, ඉටු කිරීමේ ද, ක්‍රියාවෙහි යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන ධුර දරන්නන්ගෙන් හා වෙනත් එවැනි තැනැත්තන්ගෙන් යුත් කමිටුවක් මගින් සංස්ථාවේ රීතිවලට යටත්ව පාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන අවස්ථාවේ දී සමිතියේ ධුර දරන සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කමිටුව සමන්විත විය යුතු ය.

**6**. (1) යම් මහා සභා රැස්වීමක දී හෝ තත්කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණ සිටින ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත සඳහන් කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සංස්ථාව විසින් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සාමාජිකයන්ගේ ධුර දරන්නන්ගේ පත්වීම් සහ නෙරපීම් ;

(ආ) සංස්ථාව හා කමිටුව විසින් පොදුවේ කටයුතු කිරීමේ දී ද, විශේෂයෙන් රැස්වීම් පැවැත්වීමේ දී ද, පිළිපැදිය යුතු ක්‍රියා මාර්ග;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ එවැනි ගිණුම් පවත්වාගෙන යාම ;

(ඈ) සංස්ථාවේ නියෝජිතයන්, සේවා නියුක්තිකයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) ඉහත සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීමට ආනුෂංගික වෙනත් කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7**. (1) සංස්ථාවට සංස්ථාවේම අරමුදලක් තිබිය යුතු අතර, රික්තවරණ, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන දායක මුදල් සංස්ථාවේ නමින් කමිටුව තීරණය කරනු ලබන බැංකුවක හෝ බැංකුවල තැන්පත් කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියළු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**8**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ආදායම් සහ වියදම් පිළිබඳව ද වත්කම් සහ බැරකම් පිළිබඳව ද වෙනත් සියළු ගනුදෙනු පිළිබඳව ද නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් "සුදුසුකම් ලත් විගණකවරයකු" විසින් විගණනය කරනු ලැබිය යුතු ය. "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(8) වගන්තියේ ඊට දී ඇති අර්ථයම තිබිය යුත්තේ ය.

සමිතියෙන් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.

**9**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවැති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කල යුතු අතර, එදිනට සමිතියට ගෙවිය යුතු සියලු ණය, සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10**. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකි විය යුතු අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව, විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11**. සභාපතිවරයා හෝ උප සභාපතිවරයකු සහ ලේකම්වරයා හෝ උප ලේකම්වරයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.